# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,308 - 2022 නොවැම්බර් මස 25 වැනි සිකුරාදා - 2022.11.25**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)


## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
| --- | --- |
| සම්මත වූ පනත් | — |
| පනත් කෙටුම්පත් | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් | — |
| පිස්කල් විකිණීම් | 864 |
| බුදල් නඩු පිළිබඳ දැන්වීම් | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් | — |
| නොතාරිස් ලැයිස්තු | — |
| විවිධ දැන්වීම් | 865 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2022 දෙසැම්බර් මස 16 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 දෙසැම්බර් මස 02 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් දැන්වීම්

**කොළඹ දිසා අධිකරණයේ දී ය.**

පිස්කල් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

මහජන බැංකුව, අංක 75, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත, කොළඹ 02.

*පැමිණිලිකරු*

නඩු අංකය : DMB/00078/2016
නුගේගොඩ
ඇස්කිසි අංකය : 28/2022
ස්වභාවය : උකස් බැඳුම්කරය
කාර්ය පටිපාටිය : සාමාන්‍ය
වටිනාකම : රු.3.357.243.37

එදිරිව

01) මහමද්දුමගේ දොන් සමන් වසන්ත කුමාර,
02) අහංගමගේ මාලනී,

දෙදෙනාම :
අංක 132, රජමහාවිහාර මාවත, මිරිහාන, කෝට්ටේ.

*විත්තිකරුවන්*

ඉහත සඳහන් කළ විත්තිකරුවන් සතු ගෙවල්, ඉඩම්, බඩු, ණය සහ හිමිකම් තහනමට ගෙන ඕනෑ නම් ඒවා විකුණා වර්ෂ 2019-08-08 වැනි දින දරන දිසා අධිකරණයේ නඩු තීන්දුවකින් ඉහත කී විත්තිකරුවන්ගෙන් අයකර ගන්නට තිබූ රුපියල් විසිදෙලක්ෂ හතලිස්අට දහස් පන්සිය අටයි ශත අනූහත (රු.2.248.508.97) ක මුදලක් (එනම් මුල් මුදල වශයෙන් රු.1,547,630.19 ක් සහ 2013-02-28 වැනි දින සිට 2015-12-02 වැනි දින දක්වා එකතු වූ පොළිය වශයෙන් රු.700,878.78 යන දෙකෙ හි එකතුව) සහ රු.1,547,630.19 ක මුදල මත 2015-12-03 දින සිට එකී මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන තෙක් වර්ෂයකට 15%ක අනුපාතයට වැඩිදුර පොළිය ද, වෙනත් ව්‍යවස්ථාපිත ගාස්තු ද, මෙහි උපලේඛනයේ විස්තර කර ඇති සියලුම දේපල සහ පරිශ්‍රය එහි ගොඩනැගිලි, සවිකිරීම්, මාර්ග අයිතිය සහ එම දේපළ සහ පරිශ්‍රයෙ හි කොටසක් හැටියට ඒ සමඟ වූ භුක්ති විඳින වෙනත් සියළු දේ ද, එම දේපළ සහ පරිශ්‍රය තුළ ඒ පිළිබඳව හෝ ඒ මත 2 වන විත්තිකරුට ඇත්තා වූ සියලු අයිතිවාසිකම් හිමිකම්, අයිතීන්, දේපළ හිමිකම් සහ ඉල්ලීම් සමඟ එම දේපළ සහ පරිශ්‍රය ඉහත සඳහන් ණය මුදල් ආපසු අයකර ගැනීම සඳහා ක්‍රියාවේ යෙදවීමට යටත් වන බවට ප්‍රකාශයට පත් කරන ලෙස,

තීන්දු ප්‍රකාශ කරන ලද ඉහත සඳහන් මුදල්, පොළී සහ ගාස්තු ගෙවීම තීන්දු ප්‍රකාශයේ දී දින සිට මාස දෙකක් ඇතුළත පැහැර හරිනු ලැබූ විට මෙහි උපලේඛනයේ වඩාත් පූර්ණ ලෙස විස්තර කර ඇති එම ඉඩම සහ පරිශ්‍රය අධිකරණය විසින් පත් කරන ලද වෙන්දේසිකරුවෙකු විසින් *ගැසට් පත්‍රයේ* සහ අවම වශයෙන් රජයේ ප්‍රවෘත්ති පත්‍ර දෙකක දැන්වීම් පළකිරීමෙන් පසුව පැ.3 සහ පැ.9 වශයෙන් සළකුණු කොට ලකුණු කොට පැමිණිල්ල සමඟ අමුණා ඇති බැඳුම්කරයන් මත ප්‍රමාණවත් යැයි එම වෙන්දේසිකරු විසින් සළකනු ලබන අධිකරණය විසින් අනුමත කරනු ලබන කොන්දේසි මත ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු අතර, එම වෙන්දේසිකරුට පහත සඳහන් පරිදි විධාන කළ යුතුය.

1. මෙහි උපලේඛනයේ විස්තර කර ඇති දේපළ සහ පරිශ්‍රය පළමුව 1949 අංක 6 දරන සංශෝධිත උකස් පනතෙ හි 52(1) වන වගන්තිය යටතේ දක්වා ඇති පවත්නා වෙළඳපොල වටිනාකමට විකිණීම සඳහා ඉදිරිපත් කළ යුතු යැයි ද, ඒ සඳහා ලංසු ඉදිරිපත් නොවූයේ නම් එවිට තීන්දු ප්‍රකාශය යටතේ ලැබිය යුතු මුදල වශයෙන් එම දැන්වීමෙහි දක්වා ඇති තක්සේරු වටිනාකමට ද එවැනි විකිණීමක දී වුව ද ලංසු ඉදිරිපත් නොවූයේ නම් ඒ එක්කම ඇති ඉහළම ලංසුවට ද විකිණීම සඳහා ඉදිරිපත් කිරීමට,

2. උකස් කරන ලද දේපළ වෙනුවෙන් ලංසු ඉදිරිපත් කොට මිල දී ගැනීම සඳහා පැමිණිලිකරුට හෝ එය වෙනුවෙන් වෙනත් අයෙකුට අවසර ලබා දීම.

මිල දී ගන්නා තැනැත්තා හෝ තැනැත්තන් විකිණීමේ කොන්දේසිවලට අනුකූලව සහ පැමිණිලිකරු මිල දී ගන්න තැනැත්තා වන විට ඉල්ලීම සහ ගාස්තුවල ප්‍රමාණයට එයට ණය ලබා දී ඇති බවට ද, මිල දී ගන්නා තැනැත්තා තුන්වන පාර්ශවයක් වන අවස්ථාවක දී ගැණුම් මිල අධිකරණයේ තැන්පත් කර ඇති බවට සෑහීමකට පත්වීමෙන් පසු යම් විකිණීමක අවශ්‍ය ඔප්පුව මිල දී ගන්නා තැනැත්තාගේ නමට නිසි ආකෘතියේ ලියා අත්සන් කර දෙන ලෙස අධිකරණය විසින් බලය පවරනු ලැබූ වෙන්දේසිකරු හෝ වෙනත් යම් තැනැත්තෙකුට විධාන කිරීම සඳහා ද, මෙහි උපලේඛනයේ විස්තර කර ඇති ඉඩමේ සහ පරිශ්‍රයෙ හි හිස් සන්තකය, මිල දී ගන්නා තැනැත්තා වෙත භාර දෙන ලෙස අධිකරණයේ පිස්කල් නිලධාරීන්ට විධාන කිරීම සඳහා ද,

අධිකරණයේ නිලධාරී මහතෙකු විසින් තක්සේරු කරන ලද නඩු ගාස්තු ද, අයකර ඒ මුදල දිසා අධිකරණයට ගෙනවිත් භාර දී ඒ, ඒ දේපළ වික්කේ කීයට ද කියාත්, කාට කාට ද කියාත් මෙහි නඩුකාරතැනට දන්වන්නට ඕනැය. මේ අඥාව එහිදී ඔබ වෙත තිබිය යුතු බවට ද දන්වා තීන්දු ප්‍රකාශ කර ඇත.

එකී තීන්දු ප්‍රකාශය අනුව ගෙවීම් කිරීමට විත්තිකරුවන් අපොහොසත් වී පැහැර හැර ඇති බැවින් එකී අධිකරණයෙන් මා වෙත ලැබී ඇති ඇස්කීසි බලපත්‍රයේ බලය පිට මා විසින්

තහනමට ගෙන ඇති ඉහත නම් සඳහන් 2 වන විත්තිකරුට අයත් පහත උපලේඛනයේ සවිස්තර ව දක්වා ඇති නිශ්චල දේපළ,

**වර්ෂ 2022 ක් වූ දෙසැම්බර් මස 16 වැනි දින පෙ. ව. 10.00 ට** ඉහත නම් සඳහන් 2 වන විත්තිකාරියගේ නිශ්චල දේපළ පිහිටි අංක 132, රජමහා විහාර මාවත, මිරිහාන, කෝට්ටේ දරන ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*උපලේඛනය*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළයේ, පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා සීමාව තුළ මිරිහාන උතුර අංක 523 දරන ග්‍රාම නිළධාරී වසමට අයත් සහ ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ වරිපනම් අංක 198, රජමහා විහාර පාර මිරිහානේ පිහිටි ඉඩමට අවසරලත් මානක ඩබ්. අහංගම මහතා විසින් 1985.01.27 වැනි දින මැන සාදන ලද අංක 3344 දරන පිඹුරේ කැබලි අංක B1 දරන උතුරට : කෝට්ටේ සිට මාදිවෙල දක්වා වන පාර, නැගෙනහිරට : කෝට්ටේ සිට මාදිවෙල දක්වා වන පාර, දකුණට : ලොට් B2, බටහිරට : ලොට් A යන මායිම් තුළ පිහිටි පර්චස් හය (පර්: 6) ක් විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ආදී සියලු දේ ද වේ. (මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඒ 339/31 හි යටතේ ලියාපදිංචි වී ඇත.)

වර්ෂ 2022 නොවැම්බර් මස 03 වැනි දින දී ය.

ටී. දුමින්දිකා සජීවනී ප්‍රනාන්දු,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
නුගේගොඩ.

11-492

---

# විවිධ දැන්වීම්

## මානව සම්පත් වෘත්තිකයන්ගේ සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

මධුර විතානගේ වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 53 (1) යටතේ මානව සම්පත් වෘත්තිකයන්ගේ සංගමය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි, යනුවෙන් දැක්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණ වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී සංගමය සංස්ථාගත කිරීමයි.

1. මානව සම්පත් වෘත්තිකයන් හමුවීමට, සහෝදරත්වයෙන් හා අදහස් හුවමාරු කර ගැනීමට සංසදයක් ලෙස සේවය කිරීම.
2. ශ්‍රී ලංකාවේ මානව සම්පත් නංවාලීම සඳහා උපාය මාර්ගික සන්ධාන ඇති කර ගැනීම සහ රාජ්‍ය වෘත්තීය සංවිධාන සමඟ සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම.
3. මානව සම්පත් සම්බන්ධ ව වඩා හොඳ පරිචයන් සහ වෘත්තීය ප්‍රමිතීන් උපදෙස්, නිර්දේශ, පුහුණු කිරීම, සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.

යනාදිය වේ.

නීතිඥ මධුර විතානගේ,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
කොළඹ දිස්ත්‍රික්කය.

11-393

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.